"මෙහෙමත් අම්මාවරු" යන සිරස්තලයෙන් යුතුව සිළුමිණ පුවත්පතේ (11/08) පළව තිබූ ලිපියකින් ඉදිරිපත් වී තිබුණේ, තරුණයෙකු විසින් බාලවයස්කාර දැරියක් ලිංගික අපයෝජනයට ලක් කිරීමේ සහ එම බාලවයස්කාර දැරියගේ මව ඊට අනුබල සැපයීමේ පුවතකි.

මෙම පුවත සමග කළු තීරුවකින් ඇස් වසා පළ කොට ඇති ඡායාරූපයකි. එම ඡායාරූපය අදාළ වින්දිතයාගේ යැයි උපකල්පනය කරන්නේ නම්, කළු තීරුවකින් ඇස් වැසීම ඔස්සේ අනන්‍යතාවය ආරක්ෂා වන්නේ යැයි අපට සිතිය හැකිද? එසේ නොවේ නම්, එය බාලවයස්කාරුවෙකුගේ අනන්‍යතාවය ආරක්ෂා කළ යුතුය යන මාධ්‍ය ආචාර ධර්මයට එරෙහි වේ. එම ඡායාරූපය එම වින්දිත බාලවයස්කරුවාගේ නොව, අහඹු ලෙසින් ලිපිය සඳහා තෝරාගත්තක් නම්, එම ඡායාරූපය පළ කිරීමේ අදාළත්වය කුමක්ද?

එසේම මෙහි දූෂණය යන යෙදුම අඩංගු වන අතර, එයින් වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වීම සහ ඒ ඔස්සේ සමාජයේ යම් කොන් කිරීමකට ලක් වීම සිදුවන බැවින්, මෙහිදී වඩාත් යෝග්‍ය යෙදුම වන්නේ ලිංගික අපයෝජනයයි.

#MediaEthicsSL #lka #SinhalaPress #Silumina